සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| වාරය - තෙවන වාරය | | |
|---|---|---|
| ශ්‍රේණිය : 9 ශ්‍රේණිය | විෂයය : සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | පාඩම : ස්ත්‍රී පුරුෂභාවයේ වගකීම් හඳුනා ගනිමු. |

- **ජෛව විද්‍යාත්මකව ස්ත්‍රී පුරුෂභාවය තීරණය වන්නේ දෙමාපියන්ගෙන් උරුම වන ජාන මඟිනි.**
- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු ,**

**සංස්කෘතික, ආගමික හා දේශපාලනික සාධක මත දෙ ආකාරයක හැසිරීම් රටා හා වගකීම් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පැවරීමේ ප්‍රවණතාවයක් ඇති බවයි.**

- **ලිංගික අනන්‍යතාව යනු ,**

**ජෛව විද්‍යාත්මක ස්ත්‍රී පුරුෂභාවය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව යම් කෙනෙකු ප්‍රකාශ කරන ලිංගික හැඩගැස්ම හා මනාපතාවයි**

- **වගකීම් රහිත ලිංගික චර්යා නිසා ඇති වියහැකි හානිදායක තත්වය**

  - අනපේක්ෂිත ගැබ් ගැනීම
  - ලිංගිකව සම්ප්‍රේෂණය වනරෝග වලට ගොදුරු වීම
  - මානසිකව බිඳ වැටීම
  - අධ්‍යාපනය කඩාකප්පල් වීම
  - සමාජ අපවාදයට ලක් වීම

- ලිංගිකත්වය හා සබැඳි චර්යාවන්හීදී වගකීමෙන් යුතුව කටයුතු කිරීම යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍යට හේතු වේ.

- විවාපත් යුවලක් අතර යහපත් අන්‍යෝන්‍ය සම්බන්ධතාව හා වගකීම් දැරීම එකිනෙකාගේ මෙන්ම දරුවන්ගේ සෞඛ්‍යටද හේතු වේ.

පැවරුම්

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුව වෙනස්කම් දැකිය හැකි අවස්ථා 3 ක් ලියන්න .
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනවබෝධය නිසා ඇතිවිය හැකි ගැටලුකාරී අවස්ථා සඳහා උදාහරණ 3 ක් ලියන්න .
3. වගකීම් රහිත ලිංගික චර්යා නිසා ඇතිවිය හැකි හානිදායක තත්ත්ව 3 ක් ලියන්න .
4. නිරෝගී දරුවෙකු බිහිකිරීම සඳහා ගැබිණි මවක අනුගමන කළ යුතු ක්‍රියාමාර්ග 3 ක් ලියන්න .
5. ගැබිණි මවකට තම සැමියාගෙන් ඉටුවියයුතු යුතුකම් හා වගකීම් තුනක් ලියන්න .
6. දරුවන් පිළිබඳව දෙමාපියන්ට ඇති වගකීම් 3 ක් ලියන්න .
7. ශ්‍රී ලංකාවේ නීතිය අනුව විවාහ වියහැකි අඩුම වයස් කීයද ?
8. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු කුමක්ද ?
9. දෙමාපියන්ගේ ආශිර්වාදය මත නිසි වයසට විවාහය සිදු වූ විට විවාහක යුවල සඳහා ලැබෙන වාසි 3 ක් ලියන්න .
10. සාර්ථක පවුල් ජීවිතයකට ඇති වන බාධක 3 ක් ලියන්න .